**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීම වෙනුවට රු.78,089,770 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් වියදම් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සභාව විසින් පරිත්‍යාග කරන ලද රු.265,500 ක් වූ වත්කම් ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.340,996 ක් වූ පුස්තකාල පොත් තොගය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රු.557,977 ක් වැයකර ඉදිකර තිබුණු දළුව පෙර පාසැල් කාර්යාල කාමරය ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් රු.273,589 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**----------------------**

ගිණුම් විෂයයන් 08 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් හා අදාල උපලේඛන අනුව වටිනාකම් අතර රු.2,527,396 ක වෙනස්කම් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-------------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්
----------------------

2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.115,571,695 ක් වූ ලැබිය යුතු ගිණුම් 09 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.66,214,118 ක් වූ ගෙවිය යුතු ගිණුම් 08 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.244,040,377 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | 129 (2) (ආ) සහ (ඊ) වගන්ති හා 150(4), 158 වගන්ති | 17,129,000 | වරිපනම් බදු, අක්කර බදු, බදුකුලී හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) | 5 (7) රීතිය | | මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (ii) | 10(4) රීතිය | | සභාවේ උප කාර්යාලවල ආදායම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. |
| (iii) | 69 රීතිය | | ඉඩම් විකිණීම සඳහා වන බදු පිළිබඳ ලේඛනයක් පී.එස්. 26 ආකෘතිය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |
| (iv) | 217 රීතිය | | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි විස්තර පී.එස්. 46 ආකෘති ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (v) | 218 රීතිය | | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 685,859 | වර්ෂ 02 ක ඉක්මවූ තැන්පතු සහා ආදායමට ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,987,905 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,079,818 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

සභාවට අයත් බැංකු ජංගම ගිණුමේ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශවල අත ඉතිරිය ලෙස රු.17,907 ක සාවද්‍ය අගයක් සටහන් කර තිබුණි.

**2.3. ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 1,664 | 1,890 | 577 | 10,201 | 1,698 | 1,842 | 1,767 | 8,888 |
| (ii) කුලී | 12,139 | 8,737 | 8,076 | 6,865 | 19,892 | 10,627 | 11,780 | 6,204 |
| (iii) බලපත්‍ර ගාස්තු | 3,800 | 1,693 | 1,693 | 63 | 3,720 | 2,402 | 2,410 | 63 |
| (iv) වෙනත් ආදායම් | 26,873 | 6,106 | 6,106 | 97 | 76,007 | 5,732 | 5,732 | 97 |

සටහන :- රැස් කළ ආදායම තුල වර්ෂය සඳහා බිල් කළ ආදායමෙන් රැස්කිරීම් සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායමෙන් රැස්කිරීම් ඇතුළත්ව තිබුණි.

**2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායම සමඟ වන රු.මිලියන 33 කින් රු. මිලියන 16 ක් පමණක් රැස්කරගෙන තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු.මිලියන 15 ක් වූ හිඟය සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 16 ක් වී තිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

සමාලෝචිත වර්ෂයට බිල්කිරීම සහ ඉකුත් වර්ෂයට හිඟ ශේෂය වූ රු.10,278,209 කින් සියයට 06 කට සමානව රු.546,750 ක් පමණක් රැස්කරගෙන තිබුණි. රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 27 කින් රු.437,350 ක් අයකරගෙන නොතිබුණු අතර නව ඉදිකිරීම් සඳහා තාවකාලික තක්සේරුවක් මත වරිපනම් අයකරගෙන නොතිබුණි.

**2.3.4 කුලී**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම හා ඉකුත් වර්ෂවල හිඟ ආදායම සමඟ වන රු.14,952,479 කින් රු.8,076,477 ක් රැස්කරගෙන තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු.6,204,276 ක් වූ හිඟ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,865,906 ක් වී තිබුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

ව්‍යාපාරික ස්ථාන 87කින් 1980 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල රු.62,985 ක් වූ හිඟ ශේෂ අයකරගෙන නොතිබුණි.

**2.3.6 වෙනත් ආදායම්**

සභාවේ ජල ව්‍යාපෘතිය මඟින් නිවාස හා ව්‍යාපාරික ස්ථාන 200කට ආසන්න ප්‍රමාණයකට ජල සම්බන්ධතා ලබා දී තිබුණු අතර, ජල ගාස්තු අයකිරීමේදී පරිභෝජනය කල ඒකක ප්‍රමාණය නොසළකා නිවසකට හෝ ව්‍යාපාරික ස්ථානයකට පිළිවෙලින් මසකට රු.30 ක් සහ රු.75 ක් ලෙස බිල්කර තිබුණි. පසුගිය වර්ෂ 12ක කාලය තුල ජල ගාස්තු ගෙවා නොතිබුණු පාරිභෝගිකයින් නිරීක්ෂණය වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට රු.361,713ක හිඟ ජල ගාස්තුවක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 14 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැළැස්ම

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙල කර තිබුණ අතර, ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන නොසැළසීම

--------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අනුව වූ කර්තව්‍යයන් 42 කින් 16 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කරනු ලබන කසළ, ටොන් 07 කින් කසළ, ටොන් 03 ක් පමණ කොම්පෝස්ට් අංගනය වෙත ප්‍රවාහනය කරන අතර, ඉතිරි කසළ, වර්ග කිරීමකින් තොරව හිස් ඉඩමකට බැහැර කරමින් පැවතුණි.

(ii) කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට තෙකලා විදුලිය සපයා නොතිබූ බැවින් කසළ කැබලි කරන යන්ත්‍ර ක්‍රියාත්මක කරවීමට නොහැකි වී තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ළඟාකර ගත යුතු අරමුණු හා ඉලක්ක අනුව කාර්යාල පරිශ්‍රයක් ඉදිකිරීම හා නිසි පරිදි නිලධාරීන් ස්ථානගත කිරීම, කාර්යාලයට අවශ්‍ය උපකරණ හා පහසුකම් ලබාදීම, මාර්ග පද්ධති සංවර්ධනය, කසළ කළමනාකරණය, රුක් රෝපණ වැඩසටහන් ආරම්භ කිරීම, කඩොලාන ආරක්ෂා කිරීම හා වෙරළ තීරය ආරක්ෂා කිරීමේ වැඩසටහන් ආදී ක්‍රියාකාරකම් සිදුකර තිබුණද ඒවායේ ඉලක්ක හා ප්‍රගතිය පරීක්ෂා කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගබඩා තොග ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර, ගබඩා නිකුත් කිරීම් නියමිත නිර්දේශ හා අනුමැතිය රහිතව සිදුකර තිබුණි.

(ආ) සභා ජල ව්‍යාපෘතියේ මුළු මාසික බිල් කිරීම රු.3,860 ක් වූ අතර, ජල පොම්පාගාරයේ මාසික විදුලි බිල රු.20,530 සිට රු.30,561 ත් අතර පරාසයක විය. පරිභෝජනය කරනු ලබන ජල ඒකක ප්‍රමාණය අනුව බිල්පත් නිකුත් නොකිරීම ආදායම් අඩුවීමට හේතුවී තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ පිහිටි ත්‍රී රෝද රථ නැවතුම් පොලවල් 15 ක ත්‍රී රෝද රථ 365 ක් ගාල් කරන බව වාර්තා වුවද නැවතුම්පල ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ පවත්නා ව්‍යාපාර හඳුනාගෙන ඒ අනුව බිල් කිරීම් සිදුකල යුතු වුවත් ලැබූ ආදායම් පමණක් සැළකිල්ලට ගෙන වාර්ෂික බිල්කිරීම් සිදුකර තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දින වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,968,085 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සභා බල ප්‍රදේශය තුල තිබෙන දූරකථන සන්නිවේදන කුළුණු 27 වෙනුවෙන් සභාව විසින් ලිපිගොනු කිසිවක් පවත්වා නොතිබුණි. තවද, අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ V වන උපලේඛනය ප්‍රකාරව පෙරසැරි ගාස්තු, අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු හා සේවා ගාස්තු මෙම කුළුණුවලට අදාලව අයකර ගෙන නොතිබුණි.

(උ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබුණු කොඩි කණු 464 කින් බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණු කොඩි කණු 115 ක් ආපසු ලබා ගැනීමට හෝ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---

(අ) අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව

---

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව අනුව විධායක ශ්‍රේණියේ ලේකම් තනතුර, ද්වීතියික හා ප්‍රාථමික තනතුරු පිළිවෙලින් 08 ක හා 12 ක පුරප්පාඩු තිබූ අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල අනියම්/ආදේශක 31 දෙනෙකු අතිරික්ත වී තිබුණි.

(ආ) අයවීමට ඇති සේවක ණය

---

විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මිය ගිය සේවකයින් 59 දෙනෙකුගේ රු.349,295 ක් වූ ණය ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක සිට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

---

**3.4.1 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රුපියල් මිලියන 18 ක් පමණ වැයකර ඉදිකර තිබූ නොරොච්චෝලේ මහජන පුස්තකාලයේ උඩු මහල මුළුමනින්ම නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2016 සහ 2017 වර්ෂයේ ලැබී තිබුණු කසළ කැබලි යන්ත්‍ර සඳහා අවශ්‍ය විදුලි පහසුකම් නොමැතිවීම හේතුවෙන් එම යන්ත්‍ර නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) නොරොච්චෝලේ උප කාර්යාල භූමියේ සහ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ වාහන 05 ක් වර්ෂ 01 ත් වර්ෂ 05 අතර කාල පරාසයක් තුල භාවිතයෙන් තොරව පැවතුණි.

(ඈ) සේවකයන් දෙදෙනෙකුට පමණක් සීමාවූ නොරොච්චෝල කාර්යාලයේ සමහර කාර්යාල උපකරණ නිශ්ක්‍රීයව පැවතුණි.

**3.4.2 හඳුනාගත් පාඩු**

---

ගබඩා තොග විෂයයන් කිහිපයක් සම්බන්ධව සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව රු.49,438 ක භාණ්ඩ ඌනතාවයක් පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**4.1 අභ්‍යන්තර විගණනය**

---

ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබීම.<br>(ii) ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබීම. |
| (ආ) ආදායම් පාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) ලේඛන නඩත්තුව | උපයෝගී ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| (ඈ) ණයගැති/ණයහිමි පාලනය | ණයගැති/ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබීම |
| (ඉ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබීම |